# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2014 අගෝස්තු මස 05 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.39 ට සභාව රැස්විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරළගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (බස්නාහිර පළාතේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (සභානායකතුමා) |
| ගරු මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු සිසිර ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු හර්ෂණ සුපුන් රාජකරුණා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අශෝක දයාරත්න
අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඇ.ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
ඉසුර දේවප්‍රිය
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
උදාර රත්නායක
උදේන විජේරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එස්.එම්. මරික්කාර්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කවින්ද හේෂාන් ජයවර්ධන
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කේ.ඩී. අරුණ දීපාල්
කේ.ඩී. ලාල්කාන්ත
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගුණසිරි ජයනාත්
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
නලින්ද ජයතිස්ස
නව්සර් ෆව්සි
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පියල් නිශාන්ත
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී.අබේරත්න
ප්‍රදීප් උඩුගොඩ
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මනෝ ගනේෂන්
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මෙරිල් පෙරේරා
මොහොමඩ් මුජිබුර් රහුමාන්
මෙහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
යූ. ජෝර්ජ් පෙරේරා
රවීන්ද්‍ර යසස් කුමානායක
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වනිගරත්න
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
විජිත් ප්‍රියන්ත
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සහන් ප්‍රදීප්
සෙනල් වෙල්ගම
සුනිල් ජයමිණි
සුනිල් වටගල
සුමිත්ලාල් මැන්දිස්
සුසාර දිනාල්
හිරුණිකා එරාංජලී ප්‍රේමචන්ද්‍ර මෙනෙවිය
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

අසෝක රන්වල
ආනන්ද රංජිත් රූපසිංහ
උපාලි ගුණරත්න
එම්.එස්.එම්. රහීම්
එඩ්වඩ් ගුණසේකර
එස්. කුහවරදන්
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
නිමල් ආර්. පීරිස්
නිරෝෂන් පාදුක්ක
මංජුල බුද්ධදාස
රජිත හපුආරච්චිගේ
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
සලෝචන ගමගේ
සේනක දමයන්ත ද සිල්වා

සුසිල් කිඳෙල්පිටිය

## 01. ලිපි ලේඛන පිළිගැන්වීම :

2014 පරිපූරක ඇස්තමේන්තුව - 01 හා ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

කාර්ය පටිපාටි රීති (සංශෝධන) 2011 කෙටුම්පත උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් [සභා කටයුතු ගරු අමාත්‍යතුමා වෙනුවෙන්] ඉදිරිපත් කරන ලදී.

## 02. කාරක සභා වාර්තා :

2014.07.16 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් [කාරක සභාවේ සභාපති] ඉදිරිපත් කරන ලදී.

අනතුරුව 2014.07.23 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***පූ.භා. 10.45 ට පළාත් සභාව තාවකාලිකව අත්හිටුවන ලදින් පූ.භා. 11.28 ට යළිත් රැස් විය.***

## 03. පළාත් සභාවේ කටයුතු :

රංජිත් සෝමවංශ - ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ **IV** හා **V** වන පළාත් සභාවලදී සාකච්ඡා කර පිළියෙල කරනු ලැබ, 2011.08.04 දින බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා මගින් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතියට යොමුකරන ලද, කාර්ය පටිපාටි රීති (සංශෝධනය) - 2011 කෙටුම්පතෙහි 12 වන රීතියත්, 40 සහ 49 වන රීතීන් පිළිබඳවත් වූ නිරීක්ෂණයන්, 2013.09.03 දින ජනාධිපති ලේකම් කාර්යාලයෙන් එවා ඇති බැවින්, එකී නිරීක්ෂණයන් හා කාර්ය පටිපාටි රීති (සංශෝධනය) - 2011 කෙටුම්පත පිළිබඳව යළිත් විමසිල්ලට ලක් කර මෙම පළාත් සභාවට වාර්තා කිරීම සඳහා කාර්ය පටිපාටි රීති පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය."*

***අනතුරුව, ගරු සභාපතිතුමා විසින් ප්‍රශ්නය, කාර්ය පටිපාටි රීති පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.***

## 04. 2014 පරිපූරක ඇස්තමේන්තුව - 01 :

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව[1] සභා සම්මත විය.

*"2014 පරිපූරක ඇස්තමේන්තුව - 01 (රු. 684,000,000/-) අනුමත කළ යුතුය."*

## 05. 2014 පරිපූරක ඇස්තමේන්තුව - 01 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය :

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව[2] සභා සම්මත විය.

---

[1] 2014.08.05 දින නිල (හැන්සාඩ්) වාර්තාවේ පිටු අංක 25, 26 බලන්න.
[2] 2014.08.05 දින නිල (හැන්සාඩ්) වාර්තාවේ පිටු අංක 26 බලන්න.

*"2014 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව - 01 ට අදාළ 2014 අංක ....... දරන විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."*

## 06. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : බෝනොවන සහ බෝවන රෝගවලින් දරුවන් බේරා ගැනීමට

**අධ්‍යාපන හා සෞඛ්‍ය අමාත්‍යාංශ එක්ව සෞඛ්‍ය සමාජ පිහිටුවීම හා වැඩ සටහන් දියත් කිරීම**

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*"බස්නාහිර පළාත තුළ ජීවත් වන පාසැල් යන වයසේ දරුවන් අද දවසේ නොයෙකුත් රෝග පීඩාවලට බහුලව ගොදුරු වන අවස්ථා අප දැක ඇත. එයට බලපාන ප්‍රධාන හේතුව අයහපත් සෞඛ්‍ය පුරුදු සහ චර්යා පද්ධතිවල තිබෙන අසාමාන්‍ය වූ වෙනස්කම්ය. මේ නිසා බෝ නොවන රෝගවලට දරුවන් ගොදුරු වන අවස්ථා බොහෝය.*

*එසේම මාරාන්තික ඩෙංගු රෝගයට ද දරුවන් බහුල වශයෙන් ගොදුරු වන අතර, එයට බලපා ඇත්තේ පරිසරය පිරිසිදුවට තබා ගැනීමට අප ගන්නා උනන්දුවේ මදිකම බව පැහැදිලි වී ඇත. මෙම සියලු තත්ත්වයන් සලකා මෙවැනි රෝග පීඩාවලින් දරුවන් ගලවා ගැනීමේ පියවරක් ලෙස බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ව පාසල් තුළ සෞඛ්‍ය සමාජ පිහිටුවා, ඒ තුළින් දරුවන් දැනුවත් කිරීම, රෝග සඳහා ඖෂධ සහ උපදෙස් ලබා දීම හා පරිසරය පිරිසිදු කිරීම වැනි කාරණා සඳහා නීතිමය රාමුවක් තුළින් මැදිහත් විය යුතු යැයි මෙම පළාත් සභාව යෝජනා කර සිටියි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අ. භා. 12.13 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [සයපාල කෝරලගේ] මහතා මූලාසනාරූඪ විය.***

***අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 07. කල් තැබීමේ යෝජනාව :

**ගාමිණී තිලකසිරි ගරු සභානායකතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.**

*"දැන් සභාව කල් තැබිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

## 08. කල් තබන අවස්ථාවේ අසන ප්‍රශ්න :

***නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 30 යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්න මාලාවට ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් වාචිකව පිළිතුරු[3] සපයන ලදී.***

## 09. කල් තබන අවස්ථාවේ කළ යෝජනාව :

---

[3] 2014.08.05 වන දින නිල වාර්තාවේ පිටු අංක 50, 51 බලන්න.

*නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 31 (ආ) යටතේ, පානදුර, මාලමුල්ල ප්‍රදේශයේ ගල්ගොඩහේන නැමැති රජයේ ගල්වලවල් 02 ක්ද ඇති ඉඩමේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ඇරඹීමට කටයුතු කිරීම සම්බන්ධ යෝජනාව[4] ඉදිරිපත් කරන ලදී.*

## 10. රීති අංක 30 හා 31 (ආ) යටතේ යෝජනාව :

**ගාමිණී තිලකසිරි ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.**

*"සභාවේ වැඩ කටයුතු අවසන් වන තෙක් සභාවේ කාලය දීර්ඝ කළ යුතු යැයි"* යෝජනා කරනවා.

***31 (ආ) යටතේ ඉදිරිපත් කළ යෝජනාව සාකච්ඡා කොට අවසන් කරන ලදී.***

**කල් තැබීම :**

අනතුරුව, ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 01.50 ට, 2014 අගෝස්තු මස 19 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2014.08.06
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

පූර්/06
Minuts 2014.08.05 - Hansard Section

[4] 2014.08.05 වන දින නිල වාර්තාවේ පිටු අංක 53 බලන්න.